**ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගම -2017/2018**

---

ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් හා රඳවාගත් ඉපයුම් පිළිබඳ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ප්‍රමිතයේ 11 පරිච්ඡේදයෙහි 11.21 වගන්තිය ප්‍රකාරව, වසරකට වැඩි රු.19,677,602 ක් වූ ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඉන් සිදුවිය හැකි හානිකරණ අලාභය හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ 17 පරිච්ඡේදයෙහි 17.19 වගන්තිය ප්‍රකාරව, පිරිවැය රු.51,796,097 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් සමාගම විසින් අඛණ්ඩව භාවිතයට ගෙන තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල, සාධාරණ වටිනාකම ඉදිරිපත් කිරීම සඳහා වත්කමේ ඵලදායී ජීවිත කාලය හා සුන්බුන් වටිනාකම නැවත තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රමිතයේ 33 පරිච්ඡේදයෙහි 33.9 වගන්තිය ප්‍රකාරව සම්බන්ධිත පාර්ශව හා ඒවායේ පාලක මණ්ඩල සමග සමාගමේ පවතින සම්බන්ධතා හා එම පාර්ශව සමග වූ ගනුදෙනු සහ ලැබිය යුතු ගෙවිය යුතු ශේෂ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම් උපචිත පදනමට ගිණුම් නොතැබීම හේතුවෙන් වර්ෂයේ ආරම්භක හා අවසාන ලැබිය යුතු පොලී ආදායම පිළිවෙලින් රු.2,489,764 ක් හා රු.2,721,586 ක් අඩුවෙන් දක්වා තිබූ අතර වර්ෂයේ පොලී ආදායම ද රු.237,313 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික වෙන් කිරීමේදී නිලධාරීන් 8 දෙනෙකු වෙනුවෙන් වසරක කාලයක් සඳහා වැඩිපුර වෙන් කිරීම හේතුවෙන් පාරිතෝෂික වෙන්කිරීම රු.89,000 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂවල ගෙවන ලද එහෙත් ආදායම් බදු සඳහා හිලව් කරගත නොහැකි, ආර්ථික සේවා ගාස්තු රු.262,860 ක් තවදුරටත් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(උ) ආදායම් බදු ගණනය කිරීමේදී ප්‍රාග්ධන දීමනා ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් ගෙවිය යුතු ආදායම් බදු රු.468,959 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) පහත සඳහන් අයිතම සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා අදාල ස්ථාවර වත්කම් ලේඛනය හා බදු වාර්තා අනුව ශේෂයන් අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

| විෂයය | | මූල්‍ය ප්‍රකාශන අනුව | ස්ථාවර වත්කම් ලේඛන/ බදු වාර්තා අනුව - | වෙනස |
|---|---|---|---|---|
| | | රු | රු. | රු. |
| ක්ෂේත්‍ර උපකරණ | | 30,348,748 | 29,719,328 | 629,420 |
| ගෙවිය යුතු එකතු කල අගය මත බදු | | 9,005,991 | 7,879,099 | 1,126,892 |
| ආර්ථික සේවා ගාස්තු | - ආදායම | 823,872,505 | 828,484,677 | 4,612,172 |
| | වගකීම් | 1,186,660 | 1,209,652 | 22,992 |
| | ලැබිය යුතු අගය | 5,497,285 | 4,142,423 | 1,354,862 |

| | | | | |
|---|---|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බදු - | ආදායම | 823,872,505 | 828,484,677 | 4,612,172 |
| | වියදම් | 16,477,724 | 16,569,694 | 91,970 |
| | ගෙවිය යුතු අගය | 1,668,013 | 1,759,983 | 91,970 |

(එ) සම්බන්ධිත පාර්ශවයන් වෙතින් ලැබිය යුතු ශේෂ ලෙස මූල්‍ය වාර්තාවල දක්වා තිබූ වර්ෂ 1 සිට වර්ෂ 6 දක්වා කාලයක් අයනොවී පැවති රු.4,819,047 ක්වූ ශේෂයන් අදාල ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂ ලෙස දක්වා නොතිබුණු අතර අදාළ ආයතන මගින් එම ශේෂයන් තහවුරු කරද නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.11,775,525 ක් වූ වෙළඳ හා අනෙකුත් ණයගැති ශේෂයන් ද ණයගැතියන් මගින් තහවුරු කර නොතිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------------

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 31 දිනට ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

---------------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින්, පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) - තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

---------------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු පනතේ 7(ආ) වගන්තිය | සමාගම මුද්දර බදු සඳහා ලියාපදිංචි වීමට හෝ රු.25,000 ට වැඩි පාරිශ්‍රමික ගෙවීමේදී අයකරගත යුතු මුද්දර ගාස්තුව අයකරගෙන දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 136 හා 138 | සමාගමේ සේවක අත්තිකාරම් හා මිලදී ගැනීම් අත්තිකාරම් පියවීමේදී වවුචර් අනුමත කර හෝ සහතික කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. |
| (ඇ) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය අනුමැතිය ලබාගැනීමකින් තොරව විධිවිධාන වලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 9 කදී රු.100,000 ක උපරිම සීමාව ඉක්මවා රු.4,173,098 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම හා රු.25,000 ක උපරිම සීමාව ඉක්මවා අවස්ථා 14 කදී රු.775,000 ක සුළු මුදල් අග්‍රිම ලබාදී තිබූ අතර රු.5,000 ක් වූ සුළු මුදල් වියදම් සීමාව ඉක්මවා අවස්ථා 15 ක දී රු.249,355 ක් වැය කර තිබුණි. තවද 2017/2018 වර්ෂයට අදාලව නිකුත් කළ අත්තිකාරම් 2018 මාර්තු 31 දින වන විට පියවිය යුතු වුවද එදිනට නොපියවූ රු.4,054,121 ක් වූ අත්තිකාරම් ශේෂ 44 ක් විය. |
| (ඈ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | (i) 5.2 ඡේදය | අයවැය ලේඛනය සමග අයවැයගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) 8.3.3 ඡේදය | සේවකයන්ට ලබා දිය යුතු ප්‍රසාද දීමනාවේ උපරිමය මාස 2 ක වැටුප වුවද ඊට පටහැනිව මාස 3 ක වැටුප ප්‍රසාද දීමනා ලෙස සලකා 2016/2017 වර්ෂයේ රු.7,879,524 ක් ගෙවා තිබුණි. තවද කොන්ත්‍රාත් සේවකයන් වූ සමාගමේ සියළු සේවකයන්ට ප්‍රසාද දීමනා ගෙවීමේදී පැමිණීම සලකා නොතිබුණි. |
| (ඉ) | 2017 දෙසැම්බර් 11 දිනැති අංක පීඊඩී 03/2017 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් සකසා ලාභ හඳුනා ගැනීමට පෙර එම වර්ෂය වෙනුවෙන් ප්‍රසාද දීමනා ලෙස සේවකයෙකුට රු. 13,500 බැගින් රු.1,692,225 ක් 2017 දෙසැම්බර් 29 දින ගෙවා තිබුණි. |
| (ඊ) | 2015 ජූනි 17 දිනැති අංක පීඊඩී 03/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | (i) 2.2 ඡේදය | F කාණ්ඩයේ රාජ්‍ය ව්‍යවසායන් සඳහා සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල දීමනා රේඛීය අමාත්‍යවරයාගේ එකඟතාවය හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය මත තීරණය කර ගෙවිය යුතු වුවත් එවැනි අනුමැතියක් රහිතව සභාපතිවරයාට රු.100,000 ක මාසික දීමනාවක් හා එක් අධ්‍යක්ෂවරයෙකුට රු.6,000 හා තවත් අධ්‍යක්ෂවරු තිදෙනෙකුට රු.11,000 බැගින් වූ සහභාගීත්ව දීමනා ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ii) 2.8 ඡේදය | සමාගමේ අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු සඳහා රු.100,000 බැගින් වූ රු.300,000 ක ගරු දීමනා රේඛීය අමාත්‍යවරයාගේ නිර්දේශ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය රහිතව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ගෙවා තිබුණි. |
| (උ) 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී/57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 02 හා 03 ඡේද | සමාගම සඳහා වාර්ෂික ප්‍රචාරණ වැඩසටහන හෝ සාමාජීය වගකීම් ඉටුකිරීමේ වැඩසටහන සකස්කර අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 05 ඡේදය | සමාගමේ ප්‍රචාරණ හා ප්‍රවර්ධන වියදම් සඳහා අයවැයගත රු.3,648,000 ක සීමාව ඉක්මවා රු.356,654 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණි. |
| (iii) 06 ඡේදය | රාජ්‍ය නොවන ආයතන 4 කට සිදුකර තිබූ රු.100,000 ට වැඩි පරිත්‍යාග/ අනුග්‍රාහකත්ව සඳහා සහ පොළොන්නරුව වැලි කැණීම් ව්‍යාපෘතිවල සේවය කරන කම්කරුවන් වෙත බෙදාදීම සඳහා පුටු 3,768 ක් මිලදී ගැනීමට වැය කල රු.3,195,264 ක් සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ ශුද්ධ ලාභය රු.83,956,128 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 44,976,120 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.38,980,008 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පරිපාලන වියදම් රු.14,206,920 කින් වැඩිවූවද ව්‍යාපෘති ආදායම රු.68,050,331කින් වැඩි වීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව සමාගම සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණු අතර 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ ප්‍රධාන කාර්යය වූ වැලි කැණීම් හා අලෙවි කිරීමේ ව්‍යාපෘති හා වැලි වෙළඳපලට ඇති බලපෑම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීමත්, අනෙකුත් දිස්ත්‍රික්කවල වැලි හිඟය නැති කිරීමත් අරමුණු කරගෙන 2008 වර්ෂයේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මනම්පිටිය ප්‍රදේශයේ වැලි කැණීම සඳහා සමාගමට අවසර ලබාදී තිබුණි. එසේ වුවද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබාදී වැලි නිකුත් කළ යුතු බවට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව ගනු ලැබූ තීරණයක් මත කැණීම් කරන ලද වැලිවලින් වැඩි ප්‍රමාණයක් පොළොන්නරුව ප්‍රදේශයේ පිහිටි සමාගම් 03 ක් වෙත නිකුත් කර තිබූ අතර එම වැලි යොදාගන්නා ලද්දේ කවර කාර්යයන් සඳහාද යන්න තොරතුරු සමාගම සතුව නොතිබුණි.තවද පොළොන්නරුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් ගනු ලැබූ තීරණයක් මත සතියකට දින 3 ක් පමණක් පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් පිටතට වැලි ප්‍රවාහනය කිරීම හේතුවෙන් එහි වැලි නිෂ්පාදනයෙන් සියයට 15 ක් පමණක් දිස්ත්‍රික්කයෙන් පිටතට සපයා තිබුණි. මේ හේතුවෙන් අනිකුත් දිස්ත්‍රික්කවල වැලි හිඟයක් ඇති වී තිබූ අතර වෙළඳපල වැලි මිල ඉහල යාමට ද එය හේතුවක් වී තිබුණි.

(ii) සමාගම වෙත භාර දෙනු ලැබූ ඛණිජ කැණීමේ හා අලෙවි කිරීමේ ව්‍යාපෘති 2 කින් රු.625,207 ක ආදායම ලැබුවද වියදම රු.1,308,760 ක් වීම හේතුවෙන් රු.638,553 ක අලාභ ලබා තිබුණි.

(ආ) සමාගම විසින් ඉටු කළ යුතු කාර්යභාරය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රචාරණ මාධ්‍යයක් ලෙස සමාගමේ වෙබ් අඩවිය භාවිතාකර නොතිබූ අතර එය යාවත්කාලීන කරද නොතිබුණි.

(ඇ) වැල්ලවාය කොටිගම්බොක්ක තිරුවානා නිධිය කැණීමේ ව්‍යාපෘතිය සඳහා තිරුවානා ගබඩා කිරීම සඳහා ඉඩමක් බදු ගැනීම, පාලම් තරාදි සවි කිරීම, ආරක්ෂක කටයුතු පවත්වාගෙන යාම සහ අනිකුත් කටයුතු සඳහා ඉකුත් වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.7,864,591ක් වැයකර තිබුණද අදාල කැණීම් කටයුතු විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 15 වන විටත් ආරම්භ කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 මාර්තු 21 දිනැති අංක අමප/17/0530/704/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව යාන්ඔය ජලාශ ව්‍යාපෘතියේ වැලි කැණීමේ කටයුතු සමාගම වෙත පැවරී තිබුණද එම කාර්යය නිසි පරිදි ඉටු කිරීමට ප්‍රමාණවත් ආයතනික ශක්තිය හා යන්ත්‍රෝපකරණ පහසුකම් සමාගම සතුව නොමැතිවීම හේතුවෙන් 2017 ජූනි 27 දින අමාත්‍ය මණ්ඩල තීරණය අත්හිටුවා තිබුණි. ඒ අනුව පෞද්ගලික අංශයේ කැණීම්කරුවන් සඳහා බලපත්‍ර ලබාදී තිබූ අතර සමාගමද හෙක්ටයාර 27.5 ක භූමි ප්‍රමාණයක් සඳහා කැණීම් බලපත්‍ර ලබාගෙන තිබුණි. එසේ වුවද කැණීම් බලපත්‍ර ලබාගෙන තිබූ 2017 මැයි සිට 2018 පෙබරවාරි දක්වා කැණීම් කර තිබුණේ වැලි කියුබ් 911 ක් පමණි.

(ආ) සමාගම විසින් ඉටු කරදීමට භාරගනු ලබන උපදේශන සේවා හා පරීක්ෂණ ව්‍යාපෘතිවලට අදාලව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපෘති භාරගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රචාරණයක් හෝ විධිමත් ක්‍රමවේදයක් නොවූ අතර ව්‍යාපෘති සඳහා ලාභ ප්‍රතිපත්තියක් ද තීරණය කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුල ඉටුකරනු ලැබූ ව්‍යාපෘතිවලින් ලැබුණු ආදායම රු.1,202,988 ක් හා වියදම රු.2,651,214 ක් වීමෙන් රු.1,448,226 ක අලාභ සිදුවී තිබුණි. මෙම ව්‍යාපෘතිවලට අදාලව බාහිර පාර්ශවවල විශේෂඥ සේවය ලබාගැනීම වෙනුවෙන් උපදේශන ගාස්තු වශයෙන් රු.2,115,000 ක් දරා තිබීම ව්‍යාපෘතිවලින් අලාභ ලැබීමට හේතුවී තිබුණි. උපදේශන ව්‍යාපෘති සඳහා බාහිර පාර්ශවවල විශේෂඥ සේවය ලබා ගෙන තිබුණද ඒ සඳහා ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ඇ) සමාගමේ සභාපති වෙත යොමුකරන ලද විගණන විමසුම් 9 ක් සඳහා 2018 අගෝස්තු 30 දින තෙක් පිළිතුරු සැපයීමට කටයුතු කර නොතිබුණි. තවද විගණනය මගින් පෙන්වා දී තිබූ අඩුපාඩු නිවැරදි කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොළොන්නරුව වැලි ව්‍යාපෘතිවල වැලි අලෙවි මිල, බෙදාහැරීම, වැලි සැපයුම, සේවක වැටුප් යනාදී කටයුතු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ යුතු වුවත්, ඊට පටහැනිව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වනු ලබන දිස්ත්‍රික් කමිටු රැස්වීම්වල තීරණ මත සමාගම කටයුතු කර තිබුණි.

(ආ) සමාගම ඛණිජ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන දිස්ත්‍රික්ක 4 ක දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වා තිබූ මාසික පරිසර කමිටු හා පසුවිපරම් කමිටු රැස්වීම් 14 ක් සඳහා සමාගමේ නිලධාරීන්ද ආරාධනා මත සහභාගී වී තිබුණි. කෙසේ වුවද එහිදී සහභාගී වූ කමිටු නිලධාරීන්ට රු.5,000 ක් හා කළමනාකරණ සහකාරවරුන් 07 දෙනෙකුට රු.2,000 ක් බැගින් එකතුව රු.659,000 ක් වූ දීමනා ගෙවා තිබුණේ සමාගම විසිනි. මෙම ගෙවීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන ද නොතිබුණි.

(ඇ) මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය සංවිධානය කරන ලද අලුත් අවුරුදු උත්සවයක් සඳහා රු.250,000 ක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණද වෙනත් පෞද්ගලික පාර්ශවයක් වෙත එම ගෙවීම සිදුකර තිබුණි. විධිමත් ඉල්ලීමක් හෝ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර නොතිබියදී අදාල ගෙවීම අනුමත කිරීම හා පෞද්ගලික පාර්ශවයක් වෙත ගෙවීම මතභේදයට තුඩු දී තිබුණි.

(ඈ) වර්ෂය තුළදී රාජකාරී ගමන් සඳහා රු.මිලියන 30 කට අධික මුදලක් සංයුක්ත දීමනා, ඉන්ධන දීමනා හා ප්‍රවාහන වියදම් ලෙස දරා තිබියදී රාජකාරී ගමන් වලදී දැරීමට සිදුවන ආහාරපාන හා නවාතැන් සඳහා වූ වියදම් හා අනෙකුත් වියදම් සඳහා ද වර්ෂය තුල රු.4,248,572 ක් සුභසාධක වියදම් ලෙස දරා තිබුණි. මෙම වියදම් බොහොමයක් කිසිදු පාලනයකින් තොරව අනාර්ථිකව දරා තිබූ බවත්, වියදම් බිල්පත් ඉදිරිපත් කර මුදල් ප්‍රතිපූර්ණය කරගෙන තිබූ බවත් නිරීක්ෂණය විය. මෙහිදී රාජකාරී සඳහා සහභාගී වියයුතු අවම කාර්ය මණ්ඩලය පමණක් සහභාගී කරවීමට කටයුතු නොකිරීමත්, නවාතැන් පහසුකම් සැලසීමේදී පිරිමැසුම්දායී බව කෙරෙහි සැලකිලිමත් නොවීමත් හේතුවෙන් එක් නිලධාරියෙකුට රු.21,000 ක් දක්වා වූ ඉහල දෛනික ගාස්තුවකට තිත්ව හෝටල් කාමර ලබාගෙන තිබූ අවස්ථා හා සහභාගී වූ නිලධාරී සංඛ්‍යාවට වඩා වැඩිපුර කාමර සඳහා ගෙවීම් කර තිබූ අවස්ථා ද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

(ඉ) වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් මොංගිල්ලාරු ඔය පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුවක් පෞද්ගලික සමාගමකට භාර දී තිබූ අතර එම කටයුතු වලදී ඔයෙන් ඉවත්කරන ලද වැලි කියුබ් 20,000 ක් අලෙවි කිරීමේ කටයුතු එම සමාගම ජී.එස්.එම්.බී.ටෙක්නිකල් සර්විසස් සමාගම වෙත භාරදී තිබුණි. ඒ අනුව වැලි කියුබ් 20,000 ක ප්‍රමාණය සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබුණද ඉන් වැලි කියුබ් 5897 ක් වෙනුවෙන් රු.5,897,000 ක් පමණක් ටෙක්නිකල් සර්විසස් සමාගම විසින් පෞද්ගලික සමාගම වෙත ගෙවා තිබුණද වටිනාකම රු.28,915,663 ක ඉතිරි වැලි කියුබ් 14,103 ක් සම්බන්ධයෙන් අදාල ආදායම සමාගම වෙත ලැබී නොතිබුණු අතර කිසිදු වාර්තාගත තොරතුරක් සමාගම සතුව නොපැවතුණි. ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් සමාගම විසින් ගෙන නොතිබුණි.

## 4.4 දූශ්‍ය අක්‍රමිකතා

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 පෙබරවාරි සිට 2018 ජූනි දක්වා කාලය තුළ සමාගමේ සේවය කළ සභාපතිවරුන් දෙදෙනෙකු සඳහා නිල ප්‍රවාහන පහසුකම් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් සපයා තිබියදී සමාගම මගින්ද එම කාලපරිච්ඡේදය සඳහා මාසික කුලිය රු.150,000 හා රු.200,000 වන සේ කුලී පදනම මත වාහන ලබාදුන් බවට දක්වමින් පුද්ගලික ආයතන 6 කට එකතුව රු.4,800,000 ක් ගෙවා තිබුණි. එහිදී අදාල වාහන භාවිතා කරන ලද බවට තහවුරුවක් ලබාගෙනද නොතිබුණි. කෙසේවුවද ඉන් රු.600,000 ක් සභාපතිවරයෙකු විසින් 2018 අගෝස්තු 09 දින සමාගම වෙත ආපසු ගෙවා තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. සභාපතිවරුන් සඳහා කුලී පදනම මත වාහන ලබාගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි අනුගමනය කර නොතිබුණු අතර එසේ ලබාගෙන තිබුණු වාහන 5 ක් සඳහා බදුකුලී ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ආ) 2015 ජූනි 17 දිනැති අංක පීඊඩී PED 3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.5 ඡේදය ප්‍රකාරව අනුමත දීමනා හැර කිසිදු ගෙවීමක් අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවිය නොහැකි වුවද,

(i) මනම්පිටිය වැලි කැණීම් ව්‍යාපෘතිය යටතේ මාසිකව රු.20,000 බැගින් රු.240,000 ක් සමාලෝචිත වර්ෂය සඳහා සභාපතිවරයාට ගෙවා තිබුණි.

(ii) අධ්‍යක්ෂවරයෙකු විසින් හදාරනු ලබන පශ්චාත් උපාධි පාඨමාලාවක් සඳහා ඔහු විසින් ගෙවා තිබූ රු.425,000 ක මුදල එම අධ්‍යක්ෂවරයාට ප්‍රතිපූර්ණය කර තිබුණි. අධ්‍යක්ෂවරයා 2018 ජූලි 31 දින වන විටත් අදාල පශ්චාත් උපාධිය සම්පූර්ණ කරද නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම පිහිටුවා වසර 17 ක් ඉක්මවා තිබුණ ද, 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අනුමත සංවිධාන සැලැස්ම හා බඳවා ගැනීමේ පරිපාටිය පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි.

(ආ) සමාගම පිහිටුවීමේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව එහි කාර්ය මණ්ඩලය ප්‍රධාන විධායක නිලධාරී ඇතුලු නිලධාරීන් 05 - 06 ක් අතර විය යුතු වන අතර සමාගම විසින් ඉටු කරනු ලබන ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවා ගත යුතු විය. එසේ වුවද, ඊට පටහැනිව ව්‍යාපෘතිවල සේවකයන් 136 ක්ද ඇතුළුව 2018 ජූලි 31 දිනට 182 ක් වූ සමාගමේ සමස්ථ කාර්ය මණ්ඩලයම කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. ඒ තුළ කිසිදු

අවශ්‍යතා විශ්ලේෂණයකින් හෝ භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2017 අප්‍රේල් 01 සිට 2018 ජුලි 31 දක්වා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයන් 77 ක් සිටි අතර එම නිලධාරීන්ගේ සුදුසුකම් තහවුරු කරගෙන ද නොතිබුණි.

(ඇ) සමාගමේ කාර්යය සහ කර්තව්‍ය ඉටුකිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සපයාගෙන සිටියදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිලධාරීන් 06 දෙනෙකුගේ සේවය ලබා ගත් බව සඳහන් කර වර්ෂය තුළ රු.627,250 ක දීමනා ගෙවා තිබුණු අතර අදාල සේවකයන් ඉටුකල කාර්යභාරය කුමක්ද යන්න තහවුරු නොවීය.

(ඈ) අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අවුරුදු 60 ඉක්මවූ සේවකයන් 4 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ඉ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් අවිධිමත් ආකාරයට තෝරා එවනු ලබන පුද්ගලයන්ට සමාගම විසින් කොන්ත්‍රාත් පත්වීම් ලබාදී කාර්යාංශයේ විවිධ තනතුරුවල සේවයේ යොදවා තිබූ අතර 2018 ජුලි 31 වනවිට මෙලෙස සේවකයන් 45 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

### 4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

වැලි පැටවීම සඳහා 2009 වර්ෂයේදී රු.8,883,520 කට මිලදී ගත් පැටවුම් යන්ත්‍රයක් මනම්පිටිය වැලි ව්‍යාපෘතියට යොදවා තිබුණි. 2012 වර්ෂයෙන් පසු මෙම යන්ත්‍රය වැලි පැටවීම සඳහා භාවිතයට නොගෙන වැඩබිමේ සුළු වැඩ කටයුතු සඳහා යොදවා තිබූ අතර වැලි පැටවීම සඳහා බාහිර පාර්ශවයන්ගෙන් කුලී පදනමට පැටවුම් යන්ත්‍ර ලබාගෙන තිබුණි.

### 4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සමාගමේ සම්පත්

සමාගම විසින් බඳවාගෙන ආරක්ෂක අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරන ලද රියදුරෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.294,300 ක් හා 2018 අගෝස්තු 27 දක්වා ජනාධිපති කාර්යාලයේ වකුගඩු රෝග නිවාරණ කාර්යසාධන බලකාය වෙත අනුයුක්ත කරන ලද සම්බන්ධීකරණ නිලධාරියාට රු.232,800 ක්ද සමාගම විසින් ගෙවා තිබුණි.

### 4.8 ආර්ථික නොවූ ගනුදෙනු

2007 අංක 7 දරන සමාගම් පනතේ 133 වගන්තිය ප්‍රකාරව කොටස්හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමක් පවත්වා තිබූ අතර ඒ සමග වාර්ෂික සුහද හමුවක්ද පවත්වා ඒ සඳහා රු.1,031,445 ක වියදමක් දරා තිබුණි.

### 4.9 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ නිලධාරීන් 29 දෙනෙකුට එකතුව රු.665,000 ක සුළු මුදල් අග්‍රිම ලබා දීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) පොළොන්නරුව වැලි කැණීම් කම්කරුවන් වෙත බෙදාදීම සඳහා මිලදී ගෙන තිබූ පුටු වලින් රු.410,432 ක් වූ පුටු 484 ක් බෙදා දීමට කටයුතු කර නොතිබුණි.

**4.10 හඳුනාගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් යාන්ඔය ව්‍යාපෘතිය සඳහා සේවා ලබාදීම වෙනුවෙන් හූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සමග ගිවිසුමක් ඇතිකරගෙන තිබූ අතර එම ගිවිසුමට පරිබාහිරව ආරක්ෂක සේවකයින් 17 දෙනෙකු සහ ව්‍යාපෘති ඉංජිනේරුවරයෙකු වැඩිපුර යොදවා තිබුණි. කෙසේවුවද එහිදී එම සේවා සැපයීම වෙනුවෙන් ලැබුණු ආදායම රු.20,286,667 ක් වුවත් එහි වියදම රු.20,382,617 ක් වූයෙන් සමාගමට රු. 95,950 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) දක්ෂිණ අධිවේගී මාර්ගයට පස් සැපයීමේ ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පෞද්ගලික ආයතනයක් විසින් ඉටු කිරීමට භාරගෙන තිබූ දක්ෂිණ අධිවේගී මාර්ගයට පස් සැපයීමේ ව්‍යාපෘතියක් 2017 මැයි සිට කිසිදු හේතුවක් හෝ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් රහිතව සමාගම විසින් භාරගෙන තිබුණි.

(ii) එහිදී එම පෞද්ගලික ආයතනය වැයකල මුදල් ආපසු ගෙවීමේදී මූලික පාරිසරික සමීක්ෂණ වාර්තාව වෙනුවෙන් සමාගම අයකරගෙන තිබූ රු.1,103,895 ක්ද ආපසු ගෙවා තිබූ අතර ඒ තුළ ඇතුලත් රු.128,895 ක එකතුකල අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු මුදල දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවා තිබූ බැවින් මුළු මුදලම ආපසු ගෙවීම තුලින් සමාගමට රු.128,895 ක අලාභයක් සිදුවී තිබුණි.

(iii) පස් සැපයීමේදී ඉඩම් පුනරුත්ථාපනය සඳහා සමාගම වෙත ලැබී තිබූ රු.3,855,425 ක් තැන්පතු ගිණුමකට බැර කිරීම වෙනුවට ආදායමට බැර කිරීම හේතුවෙන් එකතු කල අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු රු.502,881 ක් ගෙවීමට සිදුවීමෙන් එම මුදල සමාගමට පාඩුවක් වී තිබුණි.

(iv) 2017 ජූලි මාසයේ ව්‍යාපෘතිය අවසන් වුවද කැණීම් භූමිය පුනරුත්ථාපන හා අනිකුත් කටයුතු වෙනුවෙන් වසරකට වඩා වැඩි කාලයක් ගතවී තිබීමෙන් 2018 ජූලි මාසය වන විට රු.5,491,433 ක වැටුප්, ආරක්ෂක වියදම් හා ගෙවල් කුලී ආදී වියදම් දැරීමට සිදුවී තිබුණි. 2018 ජූලි 31 විගණිත දින වන විට පුනරුත්ථාපන කටයුතු සම්පූර්ණ කර ද නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව ජීඑස්එම්බී ටෙක්නිසල් සර්විසස් (පුද්) සමාගම විසින් දැනුවත්වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂයක් අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2018 අගෝස්තු 20 දින වන අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

### 6.2 අභ්‍යන්තර විගණනය

ගිණුම් වර්ෂය ආරම්භ වීමට ප්‍රථම අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අභ්‍යන්තර විගණක සමාගමේ අභ්‍යන්තර විගණක ලෙස මාස 5 ක් කටයුතු කර තිබුණද, සැලසුම් කර තිබූ පරිදි සමාගමේ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 7 ක් යටතේ විගණනය කටයුතු ඉටුකර නොතිබුණි.

### 6.3 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් මාස 03 කට වරක් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 2 ක් පමණක් පවත්වා තිබුණි.

### 6.4 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.4.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව පිළියෙල කර නොතිබූ අතර යාවත්කාලීන කර නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.2 ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහන පිළියෙල කර නොතිබුණි. තවද ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර ප්‍රසම්පාදන සැලසුම් ප්‍රකාරව මිලදී ගැනීම් සිදුකර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමකින් හෝ නිශ්චිත ක්‍රමවේදයකින් තොරව සමාගමේ සේවකයන් සඳහා වාහන 28 ක් කුලී පදනම මත ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ කුලී වාහන සඳහා ගෙවා තිබූ කුලී මුදල රු.17,874,853 ක් වූ අතර වාහන 13 කට අදාලව රු.6,215,211 ක් ගෙවීමේදී අදාල වාහන භාවිතා කළ බවට නිලධාරීන්ගේ සහතික හා ධාවන සටහන් මගින් තහවුරු කරගෙන නොතිබුණි.

#### 6.4.2 අත්හැර දැමූ ව්‍යාපෘති

2015 පෙබරවාරි 03 දින රු.2,584,750 ක අත්තිකාරම් ලබාදී තිබූ ව්‍යාපෘති 2 කට අදාලව 2016 අගෝස්තු 26 දින ගිවිසුම්වලට එළඹ තිබුණද ව්‍යාපෘති ඉටු කිරීමට අදාලව කිසිදු කාර්යයක් නොකර ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි.

## 6.5 අයවැය පාලනය

සමාගමේ අයවැය ගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 13 සිට සියයට 1898 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | (i) චෙක්පත් මගින් සිදුකල යුතු ගෙවීම් සුළු මුදලින් ගෙවා තිබීම. |
| | (ii) ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා වූ වියදම් හා ස්ථාවර වත්කම් මිලදී ගැනීම් වෙනුවෙන් වන වියදම් සඳහා සුළු මුදල් භාවිත කිරීම. |
| | (iii) ප්‍රාදේශීය මධ්‍යස්ථාන මගින් එක් රැස් කර ගනු ලබන මුදල් ආරක්ෂිතව තබා ගැනීමට හා අප්‍රමාදව බැංකුගත කිරීමට කටයුතු නොකිරීම. |
| | (iv) රාජකාරී ගමන්වලදී යැපීම් දීමනා ගෙවීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබීම. |
| | (v) රාජකාරී ගමන් වැඩසටහන් හා එහි ඇස්තමේන්තු සඳහා අංශ ප්‍රධානී හෝ ආයතන ප්‍රධානී වෙතින් පූර්ව අනුමැතිය ලබා නොගැනීම. |
| | (vi) වියදම් දැරීමේදී සකසුරුවම්බව කෙරෙහි අවධානය යොමු නොකිරීම. |
| | (vii) විවිධ රාජ්‍ය ආයතන හා සංවිධාන වෙත සිදුකරන ලද පරිත්‍යාග එම රාජ්‍ය ආයතනවලින් ලබාගන්නා ලද කුවිතාන්සි මගින් තහවුරු කර නොතිබීම. |
| (ආ) මානව සම්පත් කළමනාකරණය | මානව සම්පත් සැලැස්ම, බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටි සකස් කර ගැනීම කෙරෙහි අවධානය යොමු නොකිරීම. |
| (ඇ) වාහන පාලනය | (i) වාහන ධාවන සටහන් නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| | (ii) වාහනවල ධාවන විස්තර හා කුලී වාහන භාවිතා කිරීම සම්බන්ධ ලේඛන නඩත්තු නොකිරීම. |
| | (iii) වාහන සැපයුම්කරුවන් සමග විධිමත්ව ගිවිසුම්වලට නොඑළඹීම. |
| | (iv) ලබාගන්නා වාහනවල අන්තර්ගතවිය යුතු පිරිවිතර කල්තියා තීරණය නොකිරීම. |

| | | |
|---|---|---|
| (ඈ) අත්තිකාරම් ලබාදීම | (i) | කලින් ලබාගත් අත්තිකාරම් පියවා නොතිබියදී නැවත අත්තිකාරම් ලබාදීම. |
| | (ii) | අත්තිකාරම් ලේඛන නඩත්තු නොකිරීම. |
| | (iii) | නොපියවූ අත්තිකාරම් සම්බන්ධ පසුවිපරම් කටයුතු දුර්වල වීම. |
| (ඉ) මිලදී ගැනීම් පාලනය | (i) | සැපයුම් ඉන්වොයිසිය හා භාණ්ඩ ලැබීම් තුන්ඩුව ලැබීමෙන් පසු ගෙවීම් සිදුකිරීම වෙනුවට භාණ්ඩ ඇණවුම හෝ ඉදිරිපත් කර තිබූ මිල ගණන් පාදක කරගෙන ගෙවීම් සිදුකිරීම. |
| | (ii) | මිලදී ගැනීම් සඳහා අත්තිකාරම් නිකුත් කිරීම අදාල සැපයුම්කරු නමින් සිදුකර තිබීම. |
| | (iii) | මිලදී ගැනීම් අත්තිකාරම් ගෙවීමේදී සුරැකුම් ලබා ගැනීමට/ ගිවිසුම්වලට එළඹීමට කටයුතු නොකිරීම. |